කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව
வளிமண்டலவியல் திணைக்களம்
Department of Meteorology

TP : 011 2686686
Fax : 011 2691443
E-mail : metnmc@gmail.com
Web : www.meteo.gov.lk

නිවේදන අංකය : 01 WW/O/22/12/05/01
වර්ණය : ඇම්බර්

## තද සුළං සහ මුහුදු රළුවීම පිළිබඳ අවවාදාත්මක නිවේදනය

කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුවේ, ස්වභාවික විපත් පිළිබඳ පූර්ව අනතුරු ඇඟවීමේ මධ්‍යස්ථානය විසින්
2022 දෙසැම්බර් මස 06 දින ප.ව.3.00 තෙක් වලංගු වන පරිදි
2022 දෙසැම්බර් මස 05 දින ප.ව.3.00 ට නිකුත් කරන ලදී.

### මන්නාරම සිට කන්කසන්තුරය, ත්‍රිකුණාමලය සහ මඩකළපුව හරහා පොතුවිල් දක්වා වෙරළට ඔබ්බෙන් වන ගැඹුරු සහ නොගැඹුරු මුහුදු ප්‍රදේශ සහ ගිනිකොණ දිග සහ නිරිතදිග බෙංගාල බොක්ක සඳහා

### සැලකිලිමත් වන්න!

දකුණු අන්දමන් මුහුදු ප්‍රදේශ සහ ඊට යාබද ගිනිකොණ දිග බෙංගාල බොක්ක ආශ්‍රිතව පවතින අඩු පීඩන කලාපය දෙසැම්බර් මස 06 වන දින වනවිට පීඩන අවපාතයක් දක්වා වර්ධනය වී, බටහිරට බරව වයඹ දෙසට ගමන් කරමින් ශ්‍රී ලංකාවේ උතුරු වෙරළට ආසන්නව ගමන් කරමින් ක්‍රමයෙන් සුළි කුණාටුවක් බවට වර්ධනය වී නිරිත දිග බෙංගාල බොක්ක හරහා දෙසැම්බර් 08 වනදා වන විට තමිල්නාඩු වෙරළ තීරයට ළඟා වනු ඇතැයි අපේක්ෂා කෙරේ.

ඉදිරි දින 4 තුල අපේක්ෂා කල හැකි කාලගුණික තත්ත්වයන් පහත වගුවෙන් දැක්වේ.

| දිනය | සුළඟේ වේගය | මුහුදේ ස්වභාවය | වැසි තත්ත්වය |
|---|---|---|---|
| **2022 දෙසැම්බර් 06** | පැ.කි.මී. **(30-40)**, විටින් විට පැ.කි.මී. **55** පමණ දක්වා වැඩි විය හැක. | තරමක් රළු සිට රළු දක්වා | තැනින් තැන වැසි හෝ ගිගුරුම් සහිත වැසි ඇතිවේ. |
| **2022 දෙසැම්බර් 07** | පැ.කි.මී. **(50-60)**, විටින් විට පැ.කි.මී. **(70-80)** පමණ දක්වා වැඩි විය හැක. | ඉතා රළු | විටින් විට වැසි හෝ ගිගුරුම් සහිත වැසි ඇතිවේ. |
| **2022 දෙසැම්බර් 08** | පැ.කි.මී. **(50-70)**, විටින් විට පැ.කි.මී. **(80-90)** පමණ දක්වා වැඩි විය හැක. | ඉතා රළු සිට දළ රළු | විටින් විට වැසි හෝ ගිගුරුම් සහිත වැසි ඇතිවේ. |
| **2022 දෙසැම්බර් 09** | පැ.කි.මී. **(40-50)**, විටින් විට පැ.කි.මී. **(60-70)** පමණ දක්වා වැඩි විය හැක. | රළු සිට ඉතා රළු | තැනින් තැන වැසි හෝ ගිගුරුම් සහිත වැසි ඇතිවේ. |

අනුගමනය කල යුතු ක්‍රියාමාර්ග:

- මන්නාරම සිට කන්කසන්තුරය ත්‍රිකුණාමලය සහ මඩකළපුව හරහා පොතුවිල් දක්වා වෙරළට ඔබ්බෙන් වන ගැඹුරු සහ නොගැඹුරු මුහුදු ප්‍රදේශ වලට සහ නිරිතදිග බෙංගාල බොක්ක මුහුදු ප්‍රදේශ වලට 2022 දෙසැම්බර් 06 වන දින දහවල් 12.00 සිට නැවත දැනුම්දෙන තෙක් යාත්‍රා නොකරන ලෙස ධීවර සහ නාවික ප්‍රජාවන්ට දැනුම්දෙනු ලැබේ.

- ගිනිකොණ දිග බෙංගාල බොක්ක මුහුදු ප්‍රදේශයට නැවත දැනුම්දෙන තෙක් යාත්‍රා නොකරන ලෙස ධීවර සහ නාවික ප්‍රජාවන්ට දැනුම්දෙනු ලැබේ.

- දැනට මෙම මුහුදු ප්‍රදේශ වල ධීවර කටයුතුවල යෙදී සිටින පිරිස වහාම ගොඩ බිමට හෝ ආරක්ෂිත ස්ථානයක් වෙත පැමිණෙන ලෙසට දන්වා සිටිනු ලැබේ.

- කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව මගින් මේ සම්බන්ධව නිකුත් කරන ඉදිරි නිවේදන පිළිබඳ සිය අවධානය යොමු කරන ලෙස ධීවර හා නාවික ප්‍රජාවගෙන් ඉල්ලා සිටිනු ලැබේ.

කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව
வளிமண்டலவியல் திணைக்களம்
Department of Meteorology

TP : 011 2686686
Fax : 011 2691443
E-mail : metnmc@gmail.com
Web : www.meteo.gov.lk

**2022 දෙසැම්බර් මස 05 වනදා සවස 3.00 සිට ඉදිරි පැය 24 සඳහා**

**Advisory for Fishing and Naval Communities**
**issued at 03.00 p.m. on 05 December 2022, valid for next 24 hours**




**2022 දෙසැම්බර් මස 06 වනදා සවස 3.00 සිට ඉදිරි පැය 24 සඳහා**

**Advisory for Fishing and Naval Communities**
**issued at 03.00 p.m. on 06 December 2022, valid for next 24 hours**



කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව
வளிமண்டலவியல் திணைக்களம்
Department of Meteorology

TP : 011 2686686
Fax : 011 2691443
E-mail : metnmc@gmail.com
Web : www.meteo.gov.lk

**2022 දෙසැම්බර් මස 07 වනදා සවස 3.00 සිට ඉදිරි පැය 24 සඳහා**

**Advisory for Fishing and Naval Communities**
**issued at 03.00 p.m. on 07 December 2022, valid for next 24 hours**

